21

දෙපාර්තමේන්තු චක්‍රලේඛ: 04/2010

මගේ අංකය:AD/5/දෙපා.ච./2010
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
පේරාදෙණිය
2010.06.14

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ
සියළුම අධ්‍යක්ෂවරුන් හා ඒකක ප්‍රධානීන් වෙත

**<u>ඉවතලන කඩදාසි එකතු කිරීම හා ප්‍රතිචක්‍රියකරණය කිරීම</u>**

ඉහත කරුණට අදාලව මවිසින් 2008.11.19 දාතමින් නිකුත් කරන ලද දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 6/2008 ට ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.එහි සඳහන් උපදෙස් 2010.06.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සංශෝධනය කරනු ලබන බව මෙයින් කාරුණිකව දන්වමි.

02. එම චක්‍රලේඛයේ විධිවිධාන පරිදි ඉවතලන කඩදාසි ජාතික කඩදාසි සමාගම වෙත භාරදීමේදී පසුගිය කාලය තුළ දෙපාර්තමේන්තුවට මුහුණ පාන්නට සිදුවූ දුෂ්කරතා සම්බන්ධව එම සමාගම සමඟ කරන ලද සාකච්ඡා හා ලිපි ගනුදෙනුවලින් පසුවද, සතුටුදායක ප්‍රතිචාරයක් නොලද බැවින්, ඉවතලන කඩදාසි සම්බන්ධ වෙනත් විකල්ප ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීමට අමාත්‍යාංශ ලේකම් ගේ අනුමැතිය ඉල්ලා සිටියෙමි.

03. ඒ අනුව ජාතික කඩදාසි සමාගම ප්‍රාදේශිය එක් රැස් කිරීමේ නියෝජිතයකු පත්කරන තුරු දෙපාර්තමේන්තුවේ එකතුවන ඉවතලන කඩදාසි **ජාතික කඩදාසි සමාගම වෙතින්ද** මිළ ගණන් කැඳවා අලෙවි කිරීමට අමාත්‍යාංශ ලේකම් ගේ අංක MLDA/HR2/05 හා 2010.03.22 දිනැති ලිපියෙන් අනුමත කර ඇත. එහෙයින් මින් ඉදිරියට ඔබ අංශයේ එකතුවන ඉවතලන කඩදාසි අලෙවි කිරීම සඳහා මිළ ගණන් කැඳවන විට ජාතික කඩදාසි සමාගම වෙතින්ද මිළ ගණන් කැඳවීමට කටයුතු කල යුතුවේ.ලැබෙන මිළ ගණන් අනුව ඉවතලන කඩදාසි අලෙවිකර එම ආදායම රජයේ ගිණුමට බැර කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

04. සී.ස. ජාතික කඩදාසි සමාගමේ සම්බන්ධීකරණ විස්තර පහත පරිදි වේ.

ලිපිනය : සී,ස.ජාතික කඩදාසි සමාගම
93 .සළුසල ගොඩනැගිල්ල,
ජාවත්ත පාර
කොලඹ- 05

දුරකථන අංකය : 011-2556470 / 2556465

ෆැක්ස් අංකය : 011-2556473

ඊ - මේල් : natpaper@slt.lk

05. මෙම උපදෙස් ඔබ යටතේ අධීක්ෂණය වන ඒකකයන්හිද ක්‍රියාත්මක විය යුතු හෙයින් එම ඒකක වලටද මෙම උපදෙස් දන්වා යැවීමට මෙම චක්‍රලේඛයේ අමතර පිටපත් සංඛ්‍යාවක් මේ සමඟ ඔබ වෙත එවා ඇති බව කරුණාවෙන් සලකන්න.

ආචාර්ය ඒ.ඩී.එන්.චන්ද්‍රසිරි
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වැ.ආ.)

පිටපත: 1. ලේකම්, පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය - ඔබගේ අංක MLDA/HR2/05 හා 2010.03.22 දිනැති ලිපිය අනුව කාරුණික දැ.ගැ.පි.
2. සාමාන්‍යාධිකාරී, ජාතික කඩදාසි සමාගම,කොළඹ - කාරුණික දැ.ගැ.පි.
3. අධ්‍යක්ෂ (මුදල්),සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්මේන්තුව - දැ.ගැ.පි. හා අ.ක.ස.